# බස්නාහිර පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
# மேல் மாகாண ஆளுநர் பணிமனை
# SECRETARIAT OF THE GOVERNOR - WESTERN PROVINCE

" ජනතා හිතවාදී විශිෂ්ඨතම පළාත් රාජ්‍ය සේවාවක් "

| | | |
|---|---|---|
| ඔබේ අංකය. / உமது இல. / Your Ref. 1/4/2/5/148 | මගේ අංකය / எனது இல. / My Ref. GOS/ADM/4/7/310 | දිනය / திகத / Date 2016.09. 13 |

19 SEP 2016

19 SEP 2016

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
109, මහ විදිය
බත්තරමුල්ල,

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය</u>**

උක්ත මැයෙන් යුතු ඔබේ සමාංක හා 2016.09.01 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යාවස්ථාව 2016.09.13 දාතමින් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

අනුමත කරන ලද අදාළ ව්‍යාවස්ථාවේ පිටපතක් මේ සමග ඔබ වෙත එවමි.

අ/කලේ - පී.සෝමසිරි,
බ.ප .ආණ්ඩුකාර ලේකම්.

ජේ.සී.ජයලාල්,
පරිපාලන නිලධාරී.

පිටපත් : 1. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප) } අනුමත කරන ලද යථෝක්ත ව්‍යාවස්ථාවේ පිටපත් දෙකක් මේ සමග ඔබවෙත එවමි.

* பதில் அனுப்பும் போது தயவுசெய்து இலக்கத்தையும், திகதியையும் குறிப்பிடவும் / Please indicate my reference in the reply

| ලිපිනය / முகவரி Address | 109,. 5 වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.<br>109, 5ம் மாடி, றொட்டுண்டா கோபுரம், காலி வீதி, கொழும்பு - 03<br>109, 5th Floor, Rotunda Tower, Galle Road, Colombo 03 | | | |
|---|---|---|---|---|
| | ආණ්ඩුකාර ලේකම් /ஆளுநரின் செயலாளர் Secretary to the Governor | සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Assistant Secretary | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administartive Officer | කාර්යාලය / அலுவலகம் / Office |
| දුරකථන / தொலைபேசி / Telephone | 0112334097 | 0112334737 | 011 3159587 | 0112334347 / 0112334348 |
| ෆැක්ස්/ பெக்ஸ் / Fax | 0112334098 | 0112334738 | | |
| විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | secretary@governor.wp.gov.lk | as@governor.wp.gov.lk | ao@governor.wp.gov.lk | cma@governor.wp.gov.lk |

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.**

**1. සම්බන්ධ වන ආයතන**

| | | |
|---|---|---|
| 1.1 දෙපාර්තමේන්තුව | :- | පළාත් පාලන දෙපාර්තමේන්තුව(බ.ප)<br>යොමු අංකය :- එල්ජීඩී/02/21/03/104<br>දිනය :- 2016.04.11 |
| 1.2 අමාත්‍යංශය | :- | පළාත් පාලන අමාත්‍යංශය (බ.ප)<br>යොමු අංකය :- CM/WP/E15/5/8-8<br>දිනය :- 2016.04.25 |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | :- | යොමු අංකය :- ඩීජීඑම්එස්/ඩී/පොදු/11-2<br>දිනය :- 2012.12.19 |
| 1.4 ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය | :- | යොමු අංකය :- CSO/PTR/15/3/9<br>දිනය :- 2016-05-20 |
| 1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | :- | යොමු අංකය :-<br>දිනය :- |
| 1.6 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | :- | යොමු අංකය :- 1/4/2/5/148<br>දිනය :- 2016.09.01 |
| 1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | :- | යොමු අංකය :-<br>දිනය :- |

**2. පත් කිරීම් බලධරයා** :- මහා නගර සභාවක නම් නාගරික කොමසාරිස් වන අතර නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක නම් ලේකම් වේ.

ක්‍රියාත්මක වන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය :- කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ 2

3.2 ශ්‍රේණි :- III, II, I ශ්‍රේණි වලින් සමන්විතයි.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :- ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන කාර්යයන්හි නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූද, ඒකළ ස්වරූපයේ වූද (Single Functional) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්වීම් බලධරයා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටුකරනු ලැබිය යුතුය.

අනුමත කරමි / නොකරමි
2016/9/13
දිනය
කේ.සී. ලෝගේශ්වරන්
ආණ්ඩුකාරවර
බස්නාහිර පළාත

3.4 කාර්යයන් පැවරීම :- ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

**4 .තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :-** ස්ථිර , විශ්‍රාම වැටුප් සහිතය.

**5 .වැටුප්**

5.1 වැටුප් කේත අංකය :- MN-1 2016 (රා.ප.ච. 3/2016 අනුව)

5.2 වැටුප් පරිමාණය :- රු27140-10X300-11X350-10X495 -10 X 660 -45540/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 27,140 |
| II | පියවර 12 | 30,490 |
| I | පියවර 23 | 34,485 |

සටහන: බඳවා ගැනීම්, උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්කිරීම් ලිපි වල වැටුප් පරිමාණය සඳහන් කිරීමේදී අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම් සිදු කළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි බැව් අදාල පත්කිරීම් ලිපියේ සඳහන් කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ....... දිනය : .......

**6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු | | | කාර්යයන් |
|---|---|---|---|---|---|
| | | ආයතනය | ස්ථිර තනතුරු සංඛ්‍යාව | පෞද්ගලික වන තනතුරු සංඛ්‍යාව | |
| සෞඛ්‍ය උපදේශක | III/II/I | කොළඹ ම.න.ස | 75 | | අදාළ පළාත් පාලන ආයතන බල සීමාව තුල අඩු අදායම් ලබන මුඩුක්කු හා පැල්පත්වාසී දිළිඳු ජනතාවගේ තොරතුරු රැස්කිරීම, ඔවුන්ගේ සෞඛ්‍යයට අදාළ වාර්ෂික වැඩ සටහන් සකස් කිරීම, සමීක්ෂණ කටයුතු සහ ආයතනික අරමුණු ඉටුකර ගැනීමට ඉහළ කළමනාකරණයට සහාය වීම. |
| | | මහරගම න.ස | | 01 | |
| මැහුම් උපදේශක | III/II/I | කොළඹ ම.න.ස | 14 | | පුහුණුලාභීන් අදාළ ආයතනික කර්මාන්ත විෂය නිර්දේශය අනුව පුහුණු කිරීමේ කටයුතු ඉටු කිරීම, පුහුණුලාභීන්ගේ දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනයට ක්‍රියා කිරීම, ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉහළ කළමනාකරණයට සහාය වීම. |
| | | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ම.න.ස | 01 | | |
| | | කොළොන්නාව න.ස | | 01 | |
| උපදේශක (කාර්මික පුහුණු) | III/II/I | කොළඹ ම.න.ස | 03 | | පුහුණුලාභීන් අදාළ ආයතනික කර්මාන්ත විෂය නිර්දේශය අනුව පුහුණු කිරීමේ කටයුතු ඉටු කිරීම, පුහුණුලාභීන්ගේ දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනයට ක්‍රියා කිරීම, ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉහළ කළමනාකරණයට සහාය වීම. |
| උපදේශක (පරිගණක පුහුණු) | III/II/I | කොළඹ ම.න.ස | 01 | | පුහුණුලාභීන් අදාළ ආයතනික කර්මාන්ත විෂය නිර්දේශය අනුව පුහුණු කිරීමේ කටයුතු ඉටු කිරීම, පුහුණුලාභීන්ගේ දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනයට ක්‍රියා කිරීම, ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉහළ කළමනාකරණයට සහාය වීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රදර්ශක උපදේශක | III/II/I | කොළඹ ම.න.ස | 01 | | පුහුණුලාභීන් අදාළ ආයතනික කර්මාන්ත විෂය නිර්දේශය අනුව පුහුණු කිරීමේ කටයුතු ඉටු කිරීම, පුහුණුලාභීන්ගේ දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනයට ක්‍රියා කිරීම, ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉහළ කළමනාකරණයට සහාය වීම. |
| සංගීත හා නැටුම් උපදේශක | III/II/I | කොළඹ ම.න.ස | 04 | | පුහුණුලාභීන් සංගීත හා නැටුම් විෂය පිළිබඳව නියමිත විෂය නිර්දේශයන්ට අනුකූලව පුහුණු කිරීමේ කටයුතු කිරීම, පුහුණුලාභීන්ගේ දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනයට ක්‍රියා කිරීම, ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉහළ කළමනාකරණයට සහාය වීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :-

| | |
|---|---|
| සෞඛ්‍ය උපදේශක | - 76 |
| මැහුම් උපදේශක | - 16 |
| උපදේශක (කාර්මික පුහුණු) | - 03 |
| උපදේශක (පරිගණක පුහුණු) | - 01 |
| ප්‍රදර්ශක උපදේශක | - 01 |
| සංගීත හා නැටුම් උපදේශක | 04 |
| | 101 |

ශ්‍රේණිගත උසස්වීම් සඳහා ඒ ඒ තනතුරට අදාළව 111/11/1 ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ

## 7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

සංලක්ෂය - ප්‍රථමයෙන්ම අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන අතර සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවන්වලදී පමණක් විවෘත ව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

(ඇ) උපදේශක(කාර්මික පුහුණු) හා උපදේශක (පරිගණක පුහුණු වෘත්තීන් සඳහා අයදුම් කිරීමේදී අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබිය යුතුය.

ගරු ... විසින් අනුමත කරන ලදී ...... දිනය 20/…/9/13
ගොනු අංකය C-5/ADM/7/7/5/10

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :- බාහිර අයදුම්කරුවන් ඉල්ලුම් කරන ක්ෂේත්‍රයට අදාළව රජයේ හෝ රජය පිළිගත් ආයතනයක පහත සඳහන් පුහුණු පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම.

i **සෞඛ්‍ය උපදේශක**

ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් නිකුත් කරන සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු පාඨමාලාව හදාරා සහතිකය ලබා තිබීම.

ii **මැහුම් උපදේශක**

මැහුම් ශිල්පය සම්බන්ධයෙන් රජයේ ආයතනයක 06 මාසික හෝ ඊට වැඩි පාඨමාලාවක් හදාරා අවසාන සහතික පත්‍රය ලබා තිබීම. පෞද්ගලික ආයතනයක නම් මැහුම් විෂය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

iii **උපදේශක (කාර්මික පුහුණු)**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක යාන්ත්‍රිකරණය පිළිබඳ වසර 2 ½ පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබිය යුතුය.

සටහන - ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 4 වන මට්ටම හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය වේ .

iv **උපදේශක (පරිගණක පුහුණු)**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එක් වසරක පරිගණක ඩිප්ලෝමාවක් හදාරා අවසාන සහතිකය ලබා තිබීම.

v **ප්‍රදර්ශක උපදේශක**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක යාන්ත්‍රිකරණය පිළිබඳ වසර 2 ½ පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබිය යුතුය.

vi **සංගීතය හා නැටුම් උපදේශක**

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජාතික නැටුම් හා සංගීත විභාගය සමත්වීම/ හාත්බණ්ඩ සංගීත විද්‍යාපීඨ නැටුම් හා සංගීත ඩිප්ලෝමා සහතිකය හෝ ජාතික තරුණ සේවා සභාවේ බෙල්වුඩ් ආයතනයේ නැටුම් හා සංගීත ඩිප්ලෝමා සහතිකය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :....CPS/ADM/1/7/3/10.... දිනය :....2014/9/15

7.2.2.3 පළපුරුද්ද :- රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක උපදේශක තනතුරක වසර 02කට නොඅඩු කාලයක් උපදේශකයෙක් ලෙස කටයුතු කර සහතිකය ලබා තිබීම.

7.2.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු වීම.
iii. යහපත් චරිතයකින් යුක්ත වීම.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අවුරුදු 18

7.2.3.2 උපරිම සීමාව :- අවුරුදු 30

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :-

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40% |
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |

උපලේඛන අංක 01 හි විෂය නිර්දේශය දැක්වේ

7.2.4.1.1 පවත්වන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.2.1 පවත්වන බලධරයා :- අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :- බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ/ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි තහවුරු කර ගැනීම හා අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්වයක් ඇති බව තහවුරු කර ගැනීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී දිනය : 2016/9/13
ගොනු අංකය : G-S/ADM/S/7/3/0

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නොවේ

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම හෝ පුවත්පත් දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :- භාෂාව සහ ගණිතය ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින් සමත්වී තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :-

අයදුම්කරුවන් ඉල්ලුම් කරන ක්ෂේත්‍රයට අදාළව රජයේ හෝ රජය පිළිගත් ආයතනයක පහත සඳහන් පුහුණු පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම.

i <u>සෞඛ්‍ය උපදේශක</u>

අදාළ නොවේ.

ii <u>මැහුම් උපදේශක</u>

මැහුම් ශිල්පය සම්බන්ධයෙන් රජයේ ආයතනයක 06 මාසික හෝ ඊට වැඩි පාඨමාලාවක් හදාරා අවසාන සහතික පත්‍රය ලබා තිබීම. පෞද්ගලික ආයතනයක නම් මැහුම් විෂය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

iii <u>උපදේශක (කාර්මික පුහුණු)</u>

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක යාන්ත්‍රීකරණය පිළිබඳ අවම වශයෙන් වසර 2 ½ පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබිය යුතුය.

සටහන - ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 4 වන මට්ටම හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය වේ .

iv <u>උපදේශක (පරිගණක පුහුණු)</u>

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එක් වසරක පරිගණක ඩිප්ලෝමාවක් හදාරා අවසාන සහතිකය ලබා තිබීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :.................... දිනය : 2014.04.13
CoS/ADM/7/7/310

v <u>ප්‍රදර්ශක</u>

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක යාන්ත්‍රීකරණය පිළිබඳ අවම වශයෙන් වසර 2 ½ පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබිය යුතුය.

vi <u>සංගීතය හා නැටුම් උපදේශක</u>

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්නු ලබන ජාතික නැටුම් හා සංගීත විභාගය සමත්වීම/ හාත්බණ්ඩ සංගීත විද්‍යාපීඨ නැටුම් හා සංගීත ඩිප්ලෝමා සහතිකය හෝ ජාතික තරුණ සේවා සභාවේ බෙල්වුඩ් ආයතනයේ නැටුම් හා සංගීත ඩිප්ලෝමා සහතිකය.

7.3.2.3 පළපුරුද්ද :- පූරප්පාඩු පවතින පළාත් පාලන ආයතනයේ යටත් පිරිසෙයින් අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති ප්‍රාථමික සේවා ශ්‍රේණියේ ස්ථිර පත්වීමක් දරන පත්වීම ස්ථිර කරනු ලබන නිලධාරීන් විය යුතුය.ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

7.3.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :-

i. යහපත් චරිතයකින් යුක්ත වීම.
ii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

7.3.3 වයස

7.3.31 අවම සීමාව :-
7.3.3.2 උපරිම සීමාව :-

දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගෙන් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමා අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1 ලිඛිත විභාගය :-

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40% |
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |

විභාග විෂය නිර්දේශය උපලේඛන අංක 1

7.3.4.1.1 පවත්වන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නොවේ

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.2.1 පවත්වන බලධරයා :- අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ :- බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි තහවුරු කර ගැනීම හා අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්වයක් ඇති බව තහවුරු කර ගැනීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
දිනය :.......
ගොනු අංකය :.......
CO3/ADM/5/7/31-

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ පත්කිරීම් බලධාරියා

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නොවේ

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ නොවේ

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- අදාළ පළාත් පාලන ආයතනය තුල අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් මඟින්

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නොවේ

## 8 කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත (උපලේඛන අංක 02) |
| 2වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත (උපලේඛන අංක 03) |
| 3වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගත වීමට පෙර | ලිඛිත (උපලේඛන අංක 04) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? :- වසරකට එක් වරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද? :-

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} අදාළ පත්කිරීම් බලධරයා.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :............... දිනය :2016/9/14
ග-ප/AD-/4/7/310

## 9 භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.01/2014 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂාව ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | අදාළ නොවේ |

## 10 ශ්‍රේණි උසස් කිරීම

10.1 සේවා ගණයේ III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.
VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය (උපලේඛන අංක 05) අනුව පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සේවයේ වසර දහය(10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 සේවා ගණයේ II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම.

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
II. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය (උපලේඛන අංක 05) අනුව පත්කිරීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සේවයේ වසර දහය (10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/4/7/31- දිනය : 2016/9/13

**11.** තනතුරුවලට පත් කිරීම :- අදාළ නොවේ

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| | | |

**12.** **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**13.** **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14.** **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය**

1. <u>මැහුම්,කාර්මික පුහුණු ,පරිගණක පුහුණු , ප්‍රදර්ශක, සංගීත හා නැටුම් උපදේශක තනතුරු සඳහා අන්තර්ග්‍රහණ ක්‍රමවේදය</u>

<u>III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම</u> :-

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක දිනට මැහුම්/කාර්මික පුහුණු/පරිගණක පුහුණු / ප්‍රදර්ශක/ සංගීත හා නැටුම් උපදේශක යන තනතුරක සක්‍රීය සේවා කාලය වසර 10ක් සපුරා නොමැති නිලධාරින් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

<u>II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම</u> :-

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක දිනට මැහුම්/ කාර්මික පුහුණු/පරිගණක පුහුණු / ප්‍රදර්ශක/ සංගීත හා නැටුම් උපදේශක යන තනතුරක සක්‍රීය සේවා කාලය වසර 10ක් සපුරා ඇති හා වසර 20ක සක්‍රීය සේවා කාලයක් සපුරා නොමැති නිලධාරින් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :................ දිනය :.....
Gos/ADM/4/7/3/10

<u>I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම</u> :-

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක දිනට මැහුම්/ කාර්මික පුහුණු/පරිගණක පුහුණු / ප්‍රදර්ශක/ සංගීත හා නැටුම් උපදේශක යන තනතුරක සක්‍රීය සේවා කාලය වසර 20ක් හෝ ඊට වැඩි සක්‍රීය සේවා කාලයක් සපුරා ඇති නිලධාරින් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

2. <u>සෞඛ්‍ය උපදේශක තනතුර සඳහා අන්තර්ග්‍රහණ ක්‍රමවේදය</u>

<u>III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම</u> :-

- මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සෞඛ්‍ය උපදේශක II ශ්‍රේණියේ තනතුරක වසර දහයක (10) සක්‍රීය සේවා කාලයක් සපුරා නොමැති නිලධාරින් ද,
- II ශ්‍රේණියේ තනතුරක වසර දහයක (10) සක්‍රීය සේවා කාලයක් සපුරා ඇතත් II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සපුරා නොවූ නිලධාරීන්ද ,
  මෙම පරිපාටිය යටතේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

- මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සෞඛ්‍ය උපදේශක II ශ්‍රේණියේ තනතුරක වසර දහයක (10) සක්‍රීය සේවා කාලයක් සපුරා ඇති හා එම ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නිලධාරීන් ද ,

- මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සෞඛ්‍ය උපදේශක I ශ්‍රේණියේ තනතුරක වසර දහයක (10) සක්‍රීය සේවා කාලයක් සපුරා නොමැති නිලධාරීන් ද ,

- I ශ්‍රේණියේ තනතුරක වසර දහයක (10) සක්‍රීය සේවා කාලයක් සපුරා ඇතත් I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවූ නිලධාරීන් ද ,
  මෙම පරිපාටිය යටතේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

- මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සෞඛ්‍ය උපදේශක I ශ්‍රේණියේ තනතුරක වසර දහයක (10) සක්‍රීය සේවා කාලයක් සපුරා ඇති I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නිලධාරීන් මෙම පරිපාටිය යටතේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**15.** මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැනනගින අවස්ථාවකදී හා/හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

**16. අර්ථ නිරූපණ**

➢ සතුටුදායක සේවා කාලය:

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්කිරීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා,අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද, ආයතන සංග්‍රහයේ ii වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ ii වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. දිනය : 2016/9/23
ගොනු අංකය : GOS/HD/M/4/7/310

➢ සක්‍රීය සේවා කාලය:-

'සක්‍රීය සේවා කාලය' යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

➢ <u>නියමිත දිනට:-</u>

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය 'නියමිත දිනය' ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධරයින්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධරයින්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

සකස් කළේ : ඒ. කේ. පී. එම්. මෛත්‍රීරත්න
නම : පරිපාලන නිලධාරි
තනතුර : පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) කොළඹ 07.
දිනය : 2016.03.31

පරීක්ෂා කළේ : සසිකා ලියනගේ
නම : නියෝජ්‍ය කොමසාරිස් (වැ. බ)
තනතුර : පළාත් පාලන දෙපාර්තමේන්තුව
දිනය : බස්නාහිර පළාත
2016.03.31

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත.
2016.04.11

---

යොමු අංකය : CM/WP/E15/5/1-8

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........
අමාත්‍යාංශ ලේකම්(බ.ප)
එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල පරිසර කටයුතු, ජලසම්පාදන හා සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
"ලාවන්‍ය මන්දිරය", තැ.පෙ. 511
32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ - 07.

දිනය : 2016/04/25

නිල මුද්‍රාව:

---

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
දිනය : 2016/9/13
යොමු අංකය : GS/ADM/4/7/13/10

යොමු අංකය : CSO/PTR/15/3/9

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........
ප්‍රධාන ලේකම්(බ.ප)

දිනය : 2016-05-20

නිල මුද්‍රාව:

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

---

යොමු අංකය : 1/4/2/5/1/48

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

දිනය : 2016.09.01

නිල මුද්‍රාව: වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

---

යොමු අංකය : ..........................................

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම, [illegible] 2016.09.13 [illegible]

අත්සන : ..........................................

ආණ්ඩුකාර ලේකම්(බ.ප)

දිනය : 2016.09.13

නිල මුද්‍රාව: පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
05වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල,
අංක: 109, ගාලු පාර, කොළඹ 03.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GS/ADM/4/7/310 දිනය : 2016.09.15

උපලේඛන අංක 01

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ - 02 සේවා ගණයේ උපදේශක තනතුරුවලට බඳවා ගැනීමේ තරග විභාගය සීමිත/විවෘත (ලිඛිත)

01. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ - 02 සේවා ගණයේ උපදේශක තනතුරුවලට බඳවා ගැනීමේ තරග විභාගය සීමිත/විවෘත (ලිඛිත)

02. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- පුරප්පාඩු ඇතිවන අවස්ථාවේදී

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනීම | ජාතික කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි. |
| බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, ක්ෂණික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :- GOS/ASA/4/7/510 දිනය :- 2016/09/13

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත
2016.09.11

උපලේඛන අංක 02

**බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ - 02 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් (ලිඛිත) පරීක්ෂණය**

01. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ - 02 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් (ලිඛිත) පරීක්ෂණය

02.විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය කාර්යාල ක්‍රම | පැය 01 | 100 | 40 |
| ආයතන කාර්ය පරිපාටිය | පැය 01 | 100 | 40 |

03.පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා

04.පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග:- සෑම වසරකටම වරක් හෝ අවශ්‍යතාවය අනුව

05.විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය කාර්යාල ක්‍රම | රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ. |
| ආයතන කාර්ය පරිපාටිය | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහයේ VII,VIII,XII,XXIV,XXVIII යන පරිච්ඡේදවල ඇති කරුණු සම්බන්ධ වූ දැනුම මැන බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. දිනය 2016/12/13
ගොනු අංකය : CPS/ADM/4/2/310

අත්සන : .........[signature].........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත
2016.09.11

උපලේඛන අංක 03

<u>බස්නාහිර පළාත් සහ රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ - 02 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් (ලිඛිත) පරීක්ෂණය</u>

01\. විභාගයේ/ වෘත්තීය පරීක්ෂණයේ නම :- බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ - 02 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් (ලිඛිත) පරීක්ෂණය

02\. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| මූල්‍ය රීති | පැය 01 | 100 | 40 |
| ආයතන කාර්ය පරිපාටිය | පැය 01 | 100 | 40 |

03\. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා

04\. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- සෑම වසරකටම වරක්

05\. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| මූල්‍ය රීති | බස්නාහිර පළාත් පාලන ආයතනවල මූල්‍ය රීති සම්බන්ධයෙන් අපේක්ෂකයා සතු සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීමේ කෙටි ප්‍රශ්න පත්‍රයකි. |
| ආයතන කාර්ය පරිපාටිය | බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහයේ VII,VIII,XII යන පරිච්ඡේදවල ඇති කරුණු සම්බන්ධ වූ දැනුම මැන බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
දිනය : 2016.12.16
ගොනු අංකය : GS/ADM/4/7/3/10

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත
2016.07.11

උපලේඛන අංක 04

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල**
**කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ - 02 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා**
**තුන්වන කාර්යක්ෂමතා කඩඉම් (ලිඛිත) පරීක්ෂණය**

01. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ - 02 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා තුන්වන කාර්යක්ෂමතා කඩඉම් (ලිඛිත) පරීක්ෂණය

02. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රයේ /විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 01 | 100 | |

03.පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා

04.පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- සෑම වසරකට වරක්

05.විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | එක් එක් තනතුරු සඳහා අදාළ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් දැනුම පරීක්ෂා කිරීම සඳහා සැකසූ ප්‍රශ්න පත්‍රයකි |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
දිනය :- 2016.09.13
ගොනු අංකය :- GS/ADM/4/7/310

අත්සන : H
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත.
දිනය : 2016.09.11

උපලේඛන අංක 05

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරෙහි ශ්‍රේණි උසස්වීම් සඳහා වූ අයදුම්පත්‍රය**

1. නිලධාරියා පිළිබඳ තොරතුරු.

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................
1.2 ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................
1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය : ..........................................................................
1.4 අයත්වන සේවය හා තනතුර : ..........................................................................
1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..........................................................................

2 පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්කිරීම් දිනය : ..........................................................................
2.2 පත්කිරීම් ස්ථිර කළ දිනය : ..........................................................................
2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම් හා සමත් වූ දිනයන්:

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය:

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3 උසස් වීමට අදාළ තොරතුරු

3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/1
3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය
3.3.1 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත.
3.3.2 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..................................................................
3.3.3 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබේද? ඔව්/නැත.
3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව්/නැත.
උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත.
3.3.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව්/නැත.

4 අයදුම්කරුගේ ප්‍රකාශය.

ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ........................... දින සිට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ 11/1 ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බව සහතික කරමි.

දිනය: ..............................................
නිලධරයාගේ අත්සන.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : .................... දිනය : 2016/09/13
G-9/HDM/4/2/510

5 <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / අංශ ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් ............................................ මහතා/මහත්මිය/මෙනෙවිය ..................................................සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවත් සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව : ........................................

6 <u>නාගරික කොමසාරිස්ගේ / ලේකම්ගේ අනුමැතිය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් ............................................ මහතා/ මහත්මිය/මෙනවිය ................................ සේවා ගණයේ .......................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත් වෙමි.ඒ අනුව ...................................................මහතා/ මහත්මිය/මෙනවිය ................................ දින සිට ......................... උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම : ........................................
අත්සන : ........................................
දිනය : ........................................
නිල මුද්‍රාව ........................................

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය :................... දිනය : 2014/9/13
GOS/ADM/4/7/3/1-